

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **56 වන කාණ්ඩය** | **බු.ව. 2557 වෙසක් මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 මැයි මස 24 වන දා** | **1 වන කලබ** |

# පින්සරු දරුවෝ



පන්සිල් රැක ගෙන
තෙල් මල් ඇරගෙන
පන්සල් යති පියකරු දරුවෝ
සෙත් වැසි වස්සන
මෙත් ගුණ සපුරන
ඒ දරුවෝ ම ය පින්සරුවෝ

ගුණෙන් නැණින් පිබිදී
මවුපියනට සුව දී
යහ මඟ යන්නෝ බොදු දරුවෝ
තුනුරුවනට ලැදි
ගුණ දහමින් බැඳි
සුවඳ යි ඒ හොඳ හෙළ දරුවෝ

**- අනඳ**



# බුදුරජාණන් වහන්සේ ගේ ආශ්චර්යවත් මනුෂ්‍යත්වය

**ශාස්ත්‍රපති පූජ්‍ය කොස්වත්තේ අරියවිමල හිමිපාණෝ**

බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ කුමාරයා හැටියට උපත ලැබුයේ මහාමායා දේවියත් සුදොවුන් මහ රජතුමාත් මව්පියන් කොට ගෙන ය. සැමට පොදු ධර්මතාව එසේ වුවත් උන්වහන්සේ සම්‍යක් සම්බෝධිය උදෙසා පිරූ පැරුම් ඇති බුද්ධාංකුරයාණන් නිසාත් සම්බෝධිය සාක්ෂාත් කළ නිසාත් තුන් ලොවට ම අග්‍ර වූ අසිරිමත් මනුෂ්‍යයෙකි. "මහණෙනි, එක් පුද්ගලයෙක් ලොවැ ඉපදීමට සමත් වූයේ ආශ්චර්යවත් මනුෂ්‍යයෙකුව උපන්නේ වෙයි. කවර එක් පුද්ගලයෙක් ද යත් : තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ය.''

(අංගුත්තර නිකාය 1)

වරක් උපස්ථාන ශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා අතර ජාතිය, නාමය, ගෝත්‍රය, සීලය, ධර්මතා, ප්‍රඥාව, විහරණය යන කරුණු වලින් බුදුරජාණන් වහන්සේ ගේ ආශ්චර්යවත් බව පිළිබඳව අතුරු කථාවක් උපන්නේ ය. එකල්හි ආනන්ද හිමියෝ ඒ භික්ෂූන්ට මෙසේ කීහ. " ඇවැත්නි, තථාගතවරයෝ ආශ්චර්ය වෙති. ආශ්චර්ය ධර්ම සමන්නාගත ද වෙති. ඇවැත්නි, තථාගතවරයෝ අද්භූත ධර්ම සමන්නාගත ද වෙති." යනුවෙනි. මේ සාකච්ඡාව දැනගත් බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා " ආනන්දය, එසේ නම් තථාගතයන් ගේ ආශ්චර්ය

අද්භූත ධර්මයෝ ඔබට අධිමාත්‍ර වශයෙන් වැටහෙත්වයි” වදාළහ. එහි දී භාග්‍යවතුන් වහන්සේ සම්මුඛයෙහි අසා පිළිගන්නා ලද කරුණු එකුන්විස්සක් පැවසූහ.

01. බෝධිසත්ත්වයෝ සිහියෙන් දැනුවත්ව තුසිතකායට එළඹුණාහ.

02. සිහියෙන් දැනුවත්ව තුසිතකායෙහි සිටියහ.

03. බෝසතාණන් වහන්සේ ආයු ඇතිතාක් තුසිතකායයෙහි සිටියහ.

04. සිහියෙන් දැනුවත්ව බෝධිසත්ත්වයෝ තුසිතකායෙන් චුතව මව්කුස පිළිසිඳ ගත්හ.

05. යම් කලෙක බෝසත්හු තුසිතකායයෙන් චුතව මව්කුස පිළිසිඳ ගත්තාහු ද එකල්හි දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා මහත් ආලෝකයක් පහළ වෙයි. සඳහිරු ආලෝකය නො ලබන ලෝකාන්තරික නරකයෙහි ද ඒ ආලෝකය පැතිරෙයි. එයින් එහි සිටින සත්ත්වයෝ එකිනෙකා දකිත්. දශසහශ්‍රී ලෝකධාතුව කම්පිත වෙයි.

06. බෝසත් මව්කුස පිළිසිඳ ගත් කල සිව්වරම් දෙවිවරු ආරක්ෂාවට පැමිණෙති.

07. බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් කල මව පංචශීලයෙන් යුතු වෙයි.

08. බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් කල මවගේ සිතෙහි පුරුෂයන් කෙරෙහි රාග සිතක් නොවෙයි. රාගසිතක් ඇති පුරුෂයකු විසින් බෝසත් මව අතික්‍රමණය නො වේ.

09. බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් කල බෝසත් මව පංචකාමගුණ ලබන සුලු වෙයි.

10. බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් කල බෝසත් මවට ආබාධ නො උපදියි.

11. බෝසතුන් උපන් සත්වන දා බෝසත් මව කලුරිය කරයි.

12. බෝසත් මව දසමසක් ම බෝසතුන් කුසින් දරා සිට ප්‍රසව කරයි.
13. බෝසත් මව හිඳ හෝ වැදහෙව හෝ නො ව සිටියා මැ බෝසතුන් ප්‍රසව කරයි.
14. යම් දිනෙක බෝසත්හු මව් කුසින් නික්මෙත් ද පළමුව දෙවියෝ පිළිගනිති. පසුව මිනිස්සු පිළිගනිති.
15. බෝසතුන් මව්කුසින් බිහිවන කල්හි බෝසතුන් පොළොවට නො පැමිණියේ ම සිව්වරම් දෙව්වරුන් විසින් පිළිගෙන "දේවිය සතුටු වන්න. ඔබට මහේශාක්‍ය පුතෙක් උපනැ"යි මව් ඉදිරියෙහි තබති.
16. යම් කලෙක බෝසත්හු මව්කුසින් බිහිවෙත් ද අපවිත්‍ර දෑ නො තැවරුණ කය ඇතිව විශද ව උපදිත්.
17. මව්කුසින් උපන් බෝසතුන්ට අහසින් හෙන එකක් සිසිල් වූ ද එකක් උණුසුම් වූ ද ජලධාරා දෙකකින් උදකකෘත්‍යය සිදු වෙයි.
18. උපන් කෙණෙහි සත් පියවරක් උතුරු දෙසට අභිමුඛව ගමන් කර 'අග්ගොහමස්මි ලෝකස්ස, සෙට්ඨොහමස්මි ලෝකස්ස, ජෙට්ඨොහමස්මි ලෝකස්ස, අයමන්තිමා ජාති නත්ථිදනි පුනබ්භවො' යන අභීත වචනය ප්‍රකාශ කරති.
19. යම් කලෙක බෝසත් මව්කුසින් බිහි වේ ද එකල්හි දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා මහත් ආලෝකයක් පහළ වෙයි. සඳහිරු ආලෝකය නො ලබන ලෝකාන්තරික නරකයෙහි ද ඒ ආලෝකය පැතිරෙයි. එයින් එහි සිටින සත්ත්වයෝ එකිනෙකා දකිත්. දසසහස්සී ලෝකධාතුව කම්පා වෙයි.

මේ කරුණුවලට සවන් දුන් බුදුරජාණන් වහන්සේ " ආනන්දය, තථාගතයන් වහන්සේට දැනුම්වත්ව ම වේදනා සංඥා උපදින බවත් දැනුම්වත්ව ම පවතින බවත් දැනුම්වත්ව ම අස්තයට යන බවත් තථාගතයන් වහන්සේ ගේ ආශ්චර්ය ධර්මයකැයි දරව"යි තවත් කරුණක් දක්වා වදාළහ.

(මජ්ඣිම නිකාය, අච්ඡරියබ්භූත සූත්‍රය)

වරක් උක්කට්ඨා හා සෙතව්‍ය යන නගරාන්තර මාවතෙහි පා ගමනින් වඩින බුදුරජාණන් වහන්සේ ගේ සටහන් දැක ලක්‍ෂණ ශාස්ත්‍රය දත් දෝණ නම් බමුණා විස්මයට පැමිණ, බුදුරදුන් හමුවට අවුත්, 'භවත්නි, ඔබ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්‍ෂයෙක් ද, මනුෂ්‍යයෙක් ද ' යනුවෙන් ප්‍රශ්න කළේ ය. එහි දී බුදුරජාණන් වහන්සේ තමන් දෙවියකු හෝ ගාන්ධර්වයකු හෝ යක්‍ෂයෙකු හෝ මනුෂ්‍යයෙකු හෝ නොවන බව වදාළහ. එසේ නම් කවරෙක්දැයි බමුණා පෙරළා ප්‍රශ්න කළේ ය.

"යම් ආස්‍රව කොටසක් ප්‍රහීණ නැති නිසා දෙවියෙක් වේ නම් ඒ ආස්‍රව මම නැවත නූපදනා ලෙස නැති කළෙමි. එමෙන් ම ගාන්ධර්ව යක්‍ෂ මනුෂ්‍ය යන තත්ත්වවලට අයත් ආස්‍රව ද ප්‍රහීණ කළෙමි. යම් සේ උපුල්, නෙළුම්, සුදුනෙළුම් ආදී මලක් දියෙහි වැඩී දියෙන් පැනනැගී දියෙහි නො ගැටී පවතින්නා සේ මම ලොවෙහි උපන්නෙමි. ලොවෙහි වැඩුණෙමි. ලෝකය අබිබවා ලෝකය විසින් අනුපලිප්ත ව වාසය කරමි. බමුණ, මා ''බුද්ධ'' යයි දැනගන්න."

මේ දෝණ සූත්‍රය සලකා බලන විට බුදුරජාණන් වහන්සේ ලොවින් ම පැනනැගී ලොව හා නො ගැටී සිටින ආශ්චර්යවත් මනුෂ්‍යයෙකි. මෙහි බුදුරජාණන් වහන්සේ තමා මනුෂ්‍යයකු නො වන බව කීමෙන් අදහස් කර ඇත්තේ උන්වහන්සේ රහත් නො වූ කෙලෙස්වලට ගොදුරු වී සිටින සාමාන්‍ය මනුෂ්‍යයෙකු හා සමාන අයකු නොවන බව ය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයකු නොවන්නේ ආධ්‍යාත්මික ගුණ විශේෂත්වය නිසා ය. එබැවින් සම්‍යක් සම්බුද්ධත්වයෙහි අද්විතීය බව උන්වහන්සේ මෙසේ දක්වති.

"මහණෙනි, තමා හා සම දෙවැන්නකු නැති බැවින් අද්විතීය වූ, සමානයකු නැති බැවින් අසහාය වූ, සමකරන්නට දෙයක් නැති බැවින් අප්පටිම වූ, ප්‍රතිපක්‍ෂ සමානයකු නැති බැවින් අප්‍රතිසම වූ, තම ධර්මයෙහි අඩුපාඩු ප්‍රකාශ කිරීමට කිසිවකු නැති හෙයින් අප්‍රතිභාග වූ, 'මම බුද්ධයෙමි'යි පිළින කරන්නට

තරම් සමත් අන්කිසිවකු නැති හෙයින් අප්‍රතිපුද්ගල වූ, සියලු පුද්ගලයන් හා අසමාන බැවින් අසම වූ, අසම වූ බුදුවරයන්ට සමාන හෙයින් අසමසම වූ, දෙපා ඇත්තවුන් හෙවත් දෙව්මිනිසුන් අතර අග්‍ර වූ එක් පුද්ගලයෙක් මේ ලෝකයෙහි උපදියි. ඒ එක ම පුද්ගලයා කවරෙක් ද යත් ඃ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ය”

බුද්ධත්වය යනු මනස උසස් කළ හැකි උසස් ම තත්ත්වය යි. පරම ශූන්‍යත්වය අවබෝධ කිරීමයි. එහි ආත්මෝත්කර්ශයක් නැත. බුදුරජාණන් වහන්සේ ආශ්චර්යවත් මනුෂ්‍යා වන්නේ ඒ නිසා ය. දීඝනිකාය අග්ගඤ්ඤ සූත්‍රයේ දී තථාගතයන් වහන්සේට ධම්මකාය, බ්‍රහ්මකාය, ධම්මභූත, බ්‍රහ්මභූත යන ව්‍යවහාර යෙදෙන බව වදුරා ඇත්තේ ඒ ගුණවිශේෂත්වය නිසා ය.

ශාස්තෘවරයකු ලෙස සිතන විට බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යාට මෙන් ම දෙවියනට ද ශාස්තෘ වී තිබේ. (සත්ථා දේවමනුස්සානං) මිනිස් පියස ඉක්මවා තම ක්‍රියාත්මක බව ප්‍රකට කළ ශාස්තෘවරයකු බව මින් පෙනේ. මෙලොවට පැමිණි දෙවියන්ට දම් දෙසුවා පමණක් නොව දේව ලෝකවලට ද ගොස් දම් දෙසූ බව පෙළ සාහිත්‍යයෙහි සඳහන් වී තිබේ. මේ කරුණෙහිලා භාග්‍යවතුන් වහන්සේ ආශ්චර්යවත් පුද්ගලයෙක් වෙති. ආනන්ද හිමියෝ දිනක් මනෝමය කයිනුත් කරජ කයිනුත් බඹලොවට එළඹීමට හැකි බව ගැන භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න කළහ. එහි දී භාග්‍යවතුන් වහන්සේ ‘ආනන්ද, මම ඍද්ධියෙන් මනෝමය කයින් බඹ ලොවට එළඹියෙම් දනිමි. මම චාතුම්මහාභූතික කයින් ඍද්ධියෙන් බඹලොවට එළඹියෙම් දනිමි’යි වදාළහ. ‘මේ කරුණු භාග්‍යවතුන් වහන්සේ සම්බන්ධයෙන් ආශ්චර්යයක් ද පුදුමයක් ද වේය යි ආනන්ද හිමියෝ පැවසූ හ.

එබස් ඇසූ බුදුරජාණන් වහන්සේ තවදුරටත් මෙසේ සඳහන් කළහ. ‘ආනන්ද, තථාගතයෝ ආශ්චර්ය වෙති. ආශ්චර්ය දහමින්

යුතු වෙති. පුදුම වෙති. පුදුම දහමින් ද යුතු වෙති. ආනන්ද, යම් සමයක තථාගත තෙමේ කයත් සිතෙහි නගා ද, සිතත් කයෙහි නගා ද, සුඛසංඥවත් සැහැල්ලු සංඥවත් කයෙහි බහා වෙසේ ද එකල්හි තථාගතයන් වහන්සේ ගේ කය ඉතා සැහැල්ලු ය. මෘදු ය. කර්මණ්‍ය ය. බබළනසුලු ය. එසමයෙහි තථාගතයන් වහන්සේ ගේ කය වාතය විසින් ගනු ලබන කපුපුළුන් ඉඹුල්පුළුන් සේ නිතැතින් ම පොළොවෙන් අහසට නගියි. උන්වහන්සේ නොයෙක් සෘද්ධිවිධ විඳිති. බඹලොව තෙක් ද කයෙන් වසඟයෙහි පවත්වති.

මෙවන් ආශ්චර්යවත් සම්‍යක් සම්බුදුවරයකු ගේ පහළ වීම යනු ලෝකයට ප්‍රඥ චක්ෂුවෙහි පහළ වීම යි. මහත් වූ ප්‍රඥලෝකයෙහි පහළ වීම යි. ප්‍රඥ ඕභාසයෙහි පහළ වීමයි. සර්වඥයන් වහන්සේ දකීම (දස්සානුත්තරිය) වචන ඇසීම (සවනානුත්තරිය) තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා ප්‍රතිලාභ (ලාභානුත්තරිය) සසුනෙහි හික්මීම (සික්ඛානුත්තරිය) බුදුරදුන්ට නිතර උපස්ථාන කිරීම (පාරිචරියානුත්තරිය) බුදුගුණ සිහිකිරීම (අනුස්සතානුස්සරිය) යන සවැදෑරුම් අනුත්තරිය ධර්මයන් ගේ පහළ වීමයි. සිවුපිළිසිඹියා (අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන) ප්‍රත්‍යක්ෂ කිරීමයි. අටලොස් වැදෑරුම් ධාතුන් ප්‍රතිවේධ කිරීමයි. ඒ ධාතුන් ගේ නා නා ස්වභාව දැනගැනීමයි. විද්‍යාවිමුක්ති ඵලයන් පසක් කිරීමයි. සෝවාන්, සකෘදගාමි, අනාගාමි, අර්හත් ඵල සාක්ෂාත් කිරීමයි. මේ ගුණ පසක් කිරීමට සත්ත්වයාට අවකාශ, එනම් ක්ෂණ සම්පත්තිය උදවෙන්නේ ඉතා දුර්ලභ වශයෙනි. බුදුරජාණන් වහන්සේ අපා දෙපා සිවුපා බුහුපා රූපී අරූපී සංඥී අසංඥී නේවසංඥීනාසංඥී වූ යම්තාක් සතත්වයෝ වෙත්නම් ඔවුනට අග්‍ර වූ ම වන බැවින් උන්වහන්සේ පිළිබඳ ප්‍රසාදය ඇතොත් එහි ඇත්තේ අග්‍ර වූ ප්‍රතිවිපාකයි.



# දරුවනට රජකම් දීම

වජිරාරාමවාසී ව වැඩ විසූ
**පඤ්ඤාසීහ මෙත්තෙය්‍ය හිමිපාණෝ**

පින්වත් දරුවෙනි,

අන්න ඉර පායනවා !

ඉර හඳටත් පිහිට වූ ශාන්තිනායකයාණන් වහන්සේ ගේ ම පුත්‍ර වූ පෙම්බර දරුවෙනි,

සව් සතුන් සුවපත් කිරීමට පුබුදිත්වා ! ඉරු නඟිත් නඟිත් මාගේ පින්වත් දරුවන් ගේ මෛත්‍රිය ද මුදුන් පත් වේවා !

මෙන්න සඳ පායනවා !

මාගේ පින්වත් දරුවෝ ද සව් සතුන් සුවපත් කෙරෙමින් පෙරමුණට යෙත් වා !

මාගේ පින්වත් දරුවෙනි !

ඉරත් බබළයි. හඳත් බබළයි. එහෙත් අනේ අමා මෑණියන් වහන්සේ නැති පාඩුව පිරිමැසීමට ඉදිරිපත් වෙත්වා !

තුනුරුවනට දිවි පුද ා සව් සතුන් සුවපත් කරනට පතන්නා වූ මාගේ මේ පින්වත් දරු පැංචන් මිස ලොවට අන් කවර පිහිටෙක් ද?

මාගේ පින්වත් දරුවෝ අමා මෑණියන් වහන්සේ ගේ කරුණාවට කාය සාක්‍ෂ්‍ය වෙත්වා !

අනේ මාගේ පින්වත් දරුවන් ගේ කයත් කරුණා කරත්තයක් වේවා !

මාගේ පින්වත් දරුවෝ තමන් යන යන තැන කරුණාව ගෙන යෙත් වා !

පින්වත් පුතුනි !

කරුණාව මුදුන් පත් වූ වෙසක් පුර පසළොස්වක දිනය පැමිණේ. මාගේ පින්වත් දරුවෝ අද ම ඒ බුදු මඟුලට සැරසෙත් වා !

මාගේ පින්වත් දරු පැටවුනි,

බුදු මඟුලට සැරසෙන්නට සිතීමත් පින් ය. දන් දෙන්නට සිතීමත් පින් ය. සිල් රකින්නට සිතීමත් පින් ය. "සියලු සත්ත්වයෝ සුවපත් වෙත් වා !" යී භාවනා කරන්නට සිතීමත් පින් ය.

මාගේ පින්වත් පිරිසුදු දරුවෝ දවසින් දවස කරුණාව හා කීකරු කම ආදි උතුම් ගුණයන් ගෙන් වැඩෙත් වා !

අනේ සාදු ! ලෝකයේ රජවරු නම් මාගේ මේ පින්වත් දරු පැංචෝ ය.

පුතුනි ! රජ්ජුරුවෝ යී කියන්නේ ලෝකය "රංජනය" කරන හෙවත් සතුටු කරන පින්වතාට ය.

ඉදින් දරුවන් ගේ අම්මලා සහ තාත්තලාත් අයියලා සහ මල්ලිලාත් අක්කලා සහ නංගිලාත් නෑයන් සහ මිතුරනුත් සතුටු කරන්නට පින්වත් දරුවන් මිස, අන් කිසිවෙක් නැත. මේ ලංකාව සහ ලෝකය සතුටු කරන්නටත් මාගේ පින්වත් දරුවන් මිස අන් කිසිවෙක් නැත.

මාගේ පින්වත් පුතුනි, බුදු පියාණන් වහන්සේ මෙන් ජනරංජනය කළා වූ හෙවත් සව් සතුන් සුවපත් කළා වූ අන් මහ රජෙක් නැත.

අනේ බුදු පියාණන් වහන්සේ ගේ රජකම මාගේ පින්වත් දරුවනට ලැබේ වා !

මාගේ පින්වත් දරුවෝ හිසේ කරුණා කිරීටය පැළැඳ අතින් කරුණා කුන්තය ගෙන කරුණා මෛත්‍රී දැසින් ම සව් සතුන් දෙස බලමින් කරුණා මෛත්‍රී දෙපයින් ම ලෝකයෙහි ඇවිදිත් වා !

අනේ මාගේ පින්වත් දරුවෝ දුටු දුටු දුප්පතුන් සුවපත් කෙරෙත් වා !

දුටු දුටු සුවපතුන් ගැන සතුටු වෙත් වා ! සව්සතුන් පරම සුවයට ම පත් කෙරෙත් වා !



## මගේ බුදු සමිඳුනි !

දෙනෙත පියවී සිටින විට දී
හිමි රුව ම පමණයි දකින්නේ
සෙමින් හමනා සිසිල් සුළඟේ
මහා ගුණ සුවඳයි හමන්නේ
සිතේ උපදින පහන් සිතුවිලි
හිමි ගැන ම පමණයි සිතෙන්නේ
නො ම පතන්නෙමි වෙනත් සරණක්
හිමි සරණ පමණ යි පතන්නේ.

**– තේෂිණී කලංසූරිය**



# වෙසඟ පොහොද
# යමු අපි පන්සල්

**(අයියා සහ නංගී අතර විරිදු ගායනයක්)**

නංගී : "සුදු රෙදි පොරවා ලා - අහළ පහළ කොයි කවුරුත්
කොහෙදෝ මේ උදෑසනින් - පාද සෙමින් තබා යන්නේ ?"

අයියා : "ඇයි නංගියෙ, දන්නෙ නැද්ද ? - උතුම් වෙසඟ පොහොය අදයි
ඔය කවුරුත් පා නඟන්නෙ - ළඟ පන්සල වෙතට යි

බොදු ළමයින් වන අප ගේ - ගෞතම බුදු සමිඳුන් ගේ
ජීවිතයට වැදගත් වන - තෙ මඟුල සිදු වුණේ අද යි"

නංගී : "අනේ ! අයියෙ කියන්න කෝ - මොනවද ඒ මංගල තුන ?
කීවොත් මට තේරෙන්නට - මම පාඩම් කර ගන්නම්"

අයියා : "උත්පත්තිය වුණේ අද යි - බුදු වීමත් වුණේ අද යි
හැම දෙනා ම දුක් වෙද්දී - පිරිනිවුමත් වුණේ අද යි"

නංගී : "ඔවු අයියේ ! තේරෙනවා - මගෙ අයියට බොහොම පින්
එහෙනම් අයියේ, අපි දැන් - පන්සල වෙත යමු කෝ !"

අයියා : "ඔවු නංගී, එහෙනම් අපි - සිල් අඳුමින් සැරසී ලා
තෙල් - මල් සහ පහන් රැගෙන - සිල් ගන්නට යමු කෝ!"

දෙදෙනාම : "බුදු සමිඳුන් සිනා සිසී - බුදු ගේ තුළ බලා ඉන්නේ
අප වාගේ හොඳ ළමයින් - පන්සල් එන කල්"

**- මුතු සීයා**

**ගුණ මිණි ආර - 09**



# වීර්යයෙන් ජීවිතය දිනාගනිමු

**"ගුරු සීයා" විසිනි.**

පින්වත් දරුවෙනි, පුද්ගලයකු බලාපොරොත්තු වන යහපත් දියුණුව සිදු කරගත හැක්කේ වීර්යයෙනි. වීර්යයක් නැති ව යෑම් ඊම් ආදි ඉරියවු පැවැත්වීමක් වත් කෑම් බීම් ආදි සාමාන්‍ය ක්‍රියාවක් වත් කළ නොහැකි ය.

වීර්යයේ දෙ පැත්තක් ඇත. එකක් කුසල් ය. අනෙක අකුසල් ය. නරක වැඩක්, සොරකම් ආදියක් කරන්නට වීර්යය අවශ්‍ය ය. එහෙත් ඒ ආකාරයේ වීර්යය තමාට ම නපුර, නින්දාව සිදු කරයි. පරලොවිනුත් දුගතිය අත්පත් කර දෙයි. ධර්මයෙහි මේ වීර්ය හැඳින්වෙන්නේ මිච්ඡා වායාම යන නමිනි.

එහෙත් හොඳ පැත්තේ වීර්යය එ බඳු නොවේ. හොඳ පැත්තේ වීර්යය කුසල් සහගත යි. ඒ වීර්යයෙන් කරන හැම දෙයකින් යහපත සැලැසෙයි. ඊට අන් අය ගේ ද පැසැසුම ලැබේ. වීර්යය වඩන තැනැත්තාට ද දෙලොවින් ම යහපත සැලැසෙයි. හොඳ - කුසල් සහගත අදහස්, කථා, ක්‍රියා ඇති කරගැනීමටත් ඒවා දියුණු කර ගැනීමටත්, නරක - අකුසල් සහගත අදහස් කථා හා ක්‍රියා දුරු කර ගැනීමටත්, එවා සම්පූර්ණයෙන් ම නොසිතෙන, නො කෙරෙන තත්ත්වයට පත් කරගැනීමටත් වීර්ය කිරීම බුදුරජාණන් වහන්සේ අපට

ඉගැන් වූ ධර්ම මාර්ගය වේ. මෙය හැඳින්වෙන්නේ සම්මා වායාම නමිනි.

කුඩා අවදියේ පටන් ම අපේ හොඳ දූ - පුතුන් නිවැරදි වීර්යය ඇති ව දියුණු වන්නට අදිටන් කරගත යුතු යි. ඒ වීර්යය පාරමිතාවකි. ඉන්ද්‍රිය ධර්මයකි. බෝධ්‍යංග ධර්මයකි. අරී අටැඟි මඟින් එකකි.

"වීරිය දිරි ගුණ දරුවෝ
කාරිය කරනට සූරුවෝ
සූරිය සිරි තෙද ගරුවෝ
ආරිය සිංහල දරුවෝ "

අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේ දරුවනට දිරි ගන්වන්නට ලියූ පැදියකි ඒ. පින්වත් දූ -පුතුනි, වීරයා කියන්නේ වීර්යය ඇති තැනැත්තාට යි. වීරත්වයේ ප්‍රධාන සාධකය වීර්යය යි. සැබෑ වීරත්වය ලොවට පෙන්වූ උත්තමයා බුදුරජාණන් වහන්සේ ය. මහ බෝසතාණන් වහන්සේ යි. මහ බෝසතාණන් වහන්සේ කිසි විටෙක වත් පසුබසින්නේ නැති ව, තමන් ගේ පිරිවර, රටවැසියන් විපත්වලින් බේරාගන්නට, දුකින් මුදවන්නට බිය නැති ව ක්‍රියා කළ සැටි අපේ පින්වත් දරුවෝත් දනිති. තිරිසන් ආත්මභාවවල සිටින අවස්ථාවල දී ද ඒ සැබෑ වීරත්වය පෙන්නුම් කළහ.

අපේ ඉතිහාසය වනාහි අපේ රටත් ජාතියත් සම්බුද්ධ ශාසනයත් වීර්යයෙන් ආරක්ෂා කළ රජවරුන්ගෙන් පොහොසත් ය. පණ්ඩුකාභය, දෙවනපෑතිස්, දුටුගැමුණු, වළගම්බා, මහ පැරැ කුම්බා ආදි රජවරු ද, ගුරුළුගෝමි, විදු සක්විති, තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි, වීදගම මාහිමි, වැලිවට සරණංකර සඟරජ මාහිමි වැනි මහ පඬිවරු ද, මෑත අවධියෙහි හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමි,

ශ්‍රීමත් අනගාරික ධර්මපාල, කුමාරතුංග මුනිදාස, සෙනරත් පරණවිතාන වැනි ශාසනික හා ජාතික පුනරුදයේ පුරෝග ාමීහු ද, ශ්‍රී ලංකා ඉතිහාසය විශිෂ්ටත්වයට පත් කළෝ ය.

එලෙසින් අපේ පින්වත් දරුවෝ ද, කාලය අපතේ නො හැර, කාලයෙන් නිසි ප්‍රයෝජන ගෙන, උදාසීන නොවී, ඉඳුරන් පිනවීමට ලොල් නොවී, අන්තර් ජාලයේ අප මුළාවට පත් කරන ඉන්ද්‍රජාලවලට අසු නොවී බුද්ධිසම්පන්නව, ඥාන සම්පන්නව, ඉදිරියට ම යන්නට, එයින් තමනුත් බැබැළී, තම රටත් ජාතියත් ශාසනයත් භාෂාවත් බබළවන්නට වීර්ය ඇති ව ධෛර්ය ඇතිව පෙරට ම යා යුතු ය. අප ගේ දරුවන් ගේ උදාසීන කම් නිසා සෙසු ජාතික දරුවෝ වීර්යවන්ත ව අධ්‍යාපනයෙන්, ඥානයෙන්, තනතුරුවලින් ඉදිරියට ම ගමන් කරන බව හැම පැත්තෙන් ම ඇසෙන කතාවකි. සිංහල ජාතිය පුරා ඉතිරී පැතිරී ගිය වීරත්වයටත්, ජාතියේ අභිමානයටත් මේ වූ කලි මහත් ශෝචනීය ආරංචියකි. ඒ අවමානය වෙනස් කරන්නට සාභිමානී දරුවෝ වැර - දිරි දරත්වා !

"තරයේ වැර වඩවු - නො නැවැත ඉදිරියට යවු
පසුබට නො වවු මඳකුත් - දියුණුව පතන ළමයිනි "

ඉහත සඳහන් කළ වීර්යය නුවණත් එකතු කරගෙන වැඩුවොත් එයින් ඉතා උතුම් ප්‍රතිඵල ලැබේ. දිනක් සිය මුත්තණුවන් පැළයක් සිටවනවා දුටු මුනුබුරෙක් "සීයේ, මේ පැළේ ගෙඩි කන්න සීයාට පුළුවන් වේ වි ද"යි ඇසී ය. මා මේ පැළේ සිටුවන්නේ මට ගෙඩි කන්න නො වේ. අනාගතේ මගේ මුනුබුරන්ටත් සතුන්ටත් කන්නට යි" සීයා ගේ ඉක්මන් පිළිතුර විය. මුත්තණුවන් ගේ වීර්යයේ පරමාර්ථය ගැන හොඳින් සිතා බලන්න.

"පඤ්ඤානුයාතං විරියං වදන්ති - සබ්බත්ථ සිද්ධිග්ගහණග්ග හත්ථං" යනුවෙන් ප්‍රඥාවට අනුකූලව යෙදූ වීර්යය (උත්සාහය)

සියලු යහපත සිදු කර දෙන උතුම් අත යැ යි ධර්මයෙහි සඳහන් වේ. සැබැවින් ම නුවණ යොදා කරන වීර්යය ම තමාටත් අන් අයටත් සෙත සලසා දෙන බව නිතර සිහි කළ යුතු යි. අතිපූජ්‍ය පැළෑණේ මහනාහිමිපාණන් ගේ මේ කවිය දෙසත් මඳක් අවධානය යොමු කරන්න.

"කොතන ද නුවණ යුතු නොපසුබට    වීරිය
එතන ම තමා මුළු දියුණුවට    කාරිය
ඉත අප සිහළ හැම සොහොවුරෙනි    ආරිය
නිතර ම වඩවු ඉන් නැණ පෙරටු    වීරිය"

**සියලු දරුවෝ වීර්යවන්ත වීරයෝ වෙත් වා !**



# වෙසඟ පුද උළෙල

සවන හිමිතුමන් බිහි වූ දිනත්    අද යි
සොබන බුදු බවට පත් වූ දිනත්    අද යි
කලණ මුනිඳු සෙත්පුර වැඩි දිනත්    අද යි
එයින බොදු දනගෙ අවුරුදු දිනත්    අද යි

එබැවින් සිරින් බබළන වෙසඟ පෝ    දින
තිදෙරින් කෙරෙන අකුසල් සැම    දුරලමින
තෙරුවන් පුද දසපින් කිරියැ    යෙදෙමින
මරණින් මිදුණ මොක්මඟ සපයව්    සුදන

**ටිබෙට් ජාතික එස් මහින්ද හිමි**



# මලක සුවඳ
## (කෙටි කතාව)

බම්බලපිටියේ සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණෝ**

.....සූත්‍ර පිටකය ගත්තම පොඩි මහත්තයා එයත් තව කොටස් පහකට බෙදෙනවා. ඒවා තමයි

දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය.....

දීඝ නිකායේ තියෙන සූත්‍ර බොහෝම දීර්ඝ සූත්‍ර..... මේ කාණ්ඩයේ තමයි මහා පරිනිර්වාණ සූත්‍රය ඒ වගේ ම ආටානාටිය සූත්‍රයත් ඇතුළත් වෙලා තියෙන්නේ.....

මජ්ඣිම නිකායේ සූත්‍ර දිහා බැලුවහම අපට තේරෙනවා ඒ සූත්‍ර දීර්ඝත් නොවන කෙටිත් නොවන සූත්‍ර දේශනාවන් බව... පුංචි කාලේ මමත් හරි ම ආසාවෙන් කියවපු කොටසක් තමයි මේ මජ්ඣිම නිකාය.....

සංයුක්ත කියන වචනෙ ඇහුණ හැටියෙ ම තේරෙනවානේ මේ සූත්‍රවල බොහෝමයක් ධර්ම කරුණු එකට කැටි කරල එකතු කරලා තියෙනවා කියලා.....

පොඩි මහත්තයට මම කියන කරුණු කාරණා තේරෙනවා ද දන්නෑ..... අපෙ හාමුදුරුවනේ මට හොඳට තේරෙනවා.

එතකොට අංගුත්තර නිකාය කියන කාණ්ඩයේ පොත්වල තියෙන්නේ විස්තර වශයෙන් දේශනා නොකරපු බොහොම කෙටි සූත්‍ර. හැබැයි සූත්‍ර කෙටි වුණාට ගැඹුරු ධර්ම කරුණු ඇතුළත් වෙලා තියෙනවා.... හැබැයි ඉතින් ඔය උඩින් පල්ලෙන් කියවන අයට නම් මේවා තේරුම් යනවා බොහොම අඩුයි.....

දැන් බලන්න පොඩි මහත්තයා ඉස්කෝලෙ දී උගන්වන පෙළ පොත ඔහේ ආවට ගියාට අවධානයක් නැතිව කියවගෙන ගියාට ඒ කරුණු මොනවද කියලවත් තේරෙනවා ද? ඒ කරුණු මනසට යනවා ද? නැහැ හාමුදුරුවනේ.....

අන්තිමට වෙන්නේ තමන්ගෙ කට රිදවාගෙන පැත්තකට වෙලා ඉන්න...... මේ වගේ වෙලාවට මට හොඳ සිංහල කියමනක් මතක් වෙනවා..... පොඩි මහත්තයා, "නටපු තොවිලෙකුත් නෑ බෙරේ පලුවකුත් නෑ" කියල කතාවක් අහල තියෙනවාද?...... අර කලින් කියපු කාරණාවට ගොඩක් ගැලපෙනවා නේ ද? මේ පිරුළු වැකිය...... එහෙමයි හාමුදුරුවනේ......

ඒ නිසා පාඩම් වැඩ කටයුතු කරන කොට හොඳ සිහියෙන් ඒ දේ කරන්න ඕනෙ. පුලුවන්නම් පොඩි වේලාවක භාවනාවක් කරල පාඩම් වැඩ ආරම්භ කළොත් හොඳට තමන් බලාපොරොත්තු වන ඉලක්ක කරා යන්නට පුලුවන් කිසිම කරදරයක් නැතිව..... පොඩි අයට විතරක් නෙමේ වැඩිහිටියන්ටත් මේවා හොඳ පාඩම්......

ඊළඟට මොකක්ද තියෙන්නේ? ඛුද්දක නිකාය අපෙ හාමුදුරුවනේ...... මේ කාණ්ඩයේ කුඩා කුඩා කොටස් වශයෙන් රසවත් සූත්‍ර ඇතුළත් පොත් පහළොවක් තියෙනවා.....

ඉතින් අද මම පොඩි මහත්තයාට කියල දෙනවා දීඝ නිකායට අයිති අග්ගඤ්ඤ සූත්‍රය.... බොහො ම රසවත්

සූත්‍රයක්. මිනිසා ඇතිවුණ හැටිත් ලෝකය ඇතිවුණ ආකාරය බුදු හාමුදුරුවෝ බොහොම ලස්සනට දේශනා කරල තියෙනවා..... හොඳට අහගන්න එහෙනම්.....

පොඩි මහත්තයා මේ ලෝකෙ ආරම්භ වුණ දවසේ ඉඳලා අවසාන වන දවස දක්වා වසර කෝටි ප්‍රකෝටි කාලයක් පවතිනවා. ඊළඟට මේ ලෝකය විනාශ වෙලා යනවා. එහෙම ඇතිවෙමින් නැතිවෙමින් පවතින දෙයක් තමයි මේ ලෝකය කියන්නේ..... ඉතින් එහෙම ලෝකයක් විනාශ වෙලා තව වසර ප්‍රකෝටි ගණනකුත් ගතවෙලා යනවා. එතකොට ඒ කාලයට කියන්නේ සංවට්ට කල්පය කියලා. මෙහෙම විනාශ වෙලා ගිහින් නැවත ලෝකය ටිකෙන් ටික අලුතින් ගොඩනැගෙන කාලයක් එනවා. ඒ යුගය හඳුන්වන්නේ විවට්ට කල්පය කියලයි.

ඉතින් මේ විවට්ට කල්ප යුගයේ දී පෘථුවිය තුළ ජීවීන්ට සුදුසු පරිසරයක් ටිකෙන් ටික නිර්මාණය වෙනවා.

මේ කතාව බොහොම රසවත් හොඳින් ම අහගන්න ඕනෙ.....

මුලින් ම මේ පෘථුවියේ මහ පොළව මොනවගේද කියනවා නම් හරියට කිරි මුට්ටියක් උණුකරලා පැත්තකින් තිබ්බහම උඩ පාවෙන යොදය වගේ. පොළව උඩ රස යොදයක් මිදිල තියෙනවා. පෘථුවිය පුරාම මේ රස පොළව තමයි හැදිල තියෙන්නේ. ඉතින් මේ දේවල් මෙහෙම සිද්ධ වෙනකොට පිටස්තර ලෝකවල තව රසවත් සිදුවීම් ගොඩක් සිදු වෙනවා.....

හාමුදුරුවනේ මට සමාවෙන්න. පොඩි ප්‍රශ්නයක් තියෙනවා..... ඔය පිටස්තර ලෝක කියන්නේ අර අපිට කියලා දෙන පිටසක්වළට ම ද? ඔව් ඔව් ඒ ගැන තමයි මම කිව්වේ......

එතකොට ඒ පිටසක්වල අර කියන පිටසක්වළ ජීවීනුත් ඉන්නවා ද?

නැතුව නැතුව අපිට අපේ ඇස් දෙකට නොපෙනෙන ජීවීන් කොච්චර නම් ඉන්නවා ද මේ විශ්වය පුරාම විවිධ ජීවීන් ඉන්නවා..... මිනිසාත් ඇතුළුව.....

ඉතින් අර කලින් කියලා දුන්න රස පොළවට උඩින් මේ පිටසක්වළ ජීවීන් පිරිසක් පාවෙවී හිටිය. ඒ ජීවීන් ඇවිත් තියෙන්නේ ආභස්සර කියන ලෝකයකින්. ඉතින් මේ අය කිරි සුදු පාටට බැබලෙන මේ පෘථුවි පොළවට බැහැල ඇවිදගෙන ගියා..... අලුත් අත්දැකීමක් නිසා මේ අය ටිකක් විනෝද වුනා..... මෙහෙම වෙන අතරෙ මේ අය අතර හිටපු එක් අයෙක් රස පොළවේ මිදිල තියෙන යොදය ටිකක් ඇඟිල්ලකට අරගෙන කටේ දාගෙන රස බැලුවා..... බොහෝම මිහිරි ප්‍රණීත රසයක්. ඉතින් මේ කෙනා අනිත් අයටත් මේ රසය ගැන කිව්වා..... ඔන්න ඉතින් එතකොට ඒ අයත් මොකද කළේ අර රස පොළවෙන් ටික ටික අරන් කටේ දාගෙන රහ බැලුවා.....

මීට කලින් මේ වගේ රසයක් එයාලාට කවදාක්වත් ම දැනිලා තිබුණෙ නෑ. මේ නිසා මේ අයට රස පොළවට තියෙන ආසාව එන්න එන්න ම වැඩි වුණා. ආසාව ටිකෙන් ටික වැඩිවෙන්න වැඩිවෙන්න වැඩිපුර කටේ දාගෙන කන්න පටන් ගත්තා...... සීමාවක් නැතිව මෙහෙම රස පොළව අනුභව කරන අතරෙ මෙයාලා දන්නේම නැතිව තවත් විශේෂ දෙයක් සිදු වුණා......

ඒ මොකක්ද දන්නව ද? පුංචි මහත්තයා..... නෑ අපේ හාමුදුරුවනේ......

මම කලින් කියල දුන්න මතකද මේ අයගෙ ඇගේ වර්ණය බොහොම ප්‍රසන්නයි. ලස්සනයි. ඒ වගේම ශරීරයෙන් ආලෝකය විහිදුවනවා කියලා....

එහෙමයි අපෙ හාමුදුරුවනේ......

ඉතින් මෙහෙම මේ පිරිස කෑදර කමින් කන්න ගිය නිසා ඔවුන් ගේ ඇගේ තිබුණ අර සුන්දර ආලෝකය ටිකෙන් ටික

නැතිවෙලා ගියා. සිරුරෙ තිබුණ සිනිඳු බව නැතිවෙලා රළු ශරීර ඇතිවුණා. දැන් ඉතින් කලින් වගේ ඔවුන් ගේ ආකාසයේ පාවෙන්නට තියෙන හැකියාව නැතිවෙලා ගියා...... පේනවා නේද කෑදර කම නිසා සිදු වුණ විපත්තිය......

පුංචි මහත්තයා දන්නවාද අපේ ශරීරයේ ආහාර එකතු වන මල්ල කොයි වගේද කියලා..... ඒ මල්ල හරියට ඉංගිරීසි හෝඩියෙ තියෙන ජේ (J) අකුර වගේ.... හරියටම දිග කිව්වොත් සෙන්ටිමීටර වලින් විසි පහයි. දැන් අපේ අත මිට මෙලෙව්වහම අතේ ප්‍රමාණය හැඩය කොයි වගේ ද අන්න ඒ වගේ තමයි අපේ ආමාශයේ ප්‍රමාණය.. අපේ උදවිය ඔය දේ තේරුම් අරගෙන තියෙන්නේ බොහොම අඩුවෙන්නේ....

ඉතින් පුංචි කාලෙ දී ම ඔය කඩ සාප්පු වල එක එක පාට කරපු රසකාරක යොදල තියෙන කෑම වර්ග පාවිච්චියට අරගෙන පුංචි කාලෙදිම අපි කවදා වත් අහල නැති ලෙඩ රෝග හදාගෙන රෝහල් වල දුක් විඳිනවා..... පේනවා නේද කෑදර කමක මහත !

දැන් ඉතින් සිරුරේ ආලෝකය නැතිවුණ රළු ශරීර ඇති පිරිසට ටිකෙන් ටික ඉර හඳ පෙනෙන්න ගත්තා. කල්ගත වෙනකොට උදේ හවස ඇති වෙනස අවබෝධ වුණා.

ක්‍රමයෙන් මේ පෘථුවියට ම අනුගත වුණ මනුෂ්‍ය පිරිසක් බවට ඔවුන් පත් වුණා.....

(ලබන කලාපයට)



# ජවනහංස ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය**

තථාගත බුදුපියාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කල දල්හධර්ම සූත්‍ර දේශනාව අරබයා මෙම ජාතකය දෙසූ සේක. දෙව්ලොව, බඹලොව වෙසෙන දිව්‍යරාජයනට මෙන් ම බ්‍රහ්මරාජයනට ඉතා දිගු ආයුෂ කාලයක් ඇති මුත් මිනිස්ලොව වෙසෙන මිනිසුන් ඇතුළු සියලු සතුන්ගේ ආයුෂ කෙටි බැව් බුදුරජාණන් වහන්සේ පහදා දුන්හ. සූත්‍ර දේශනාව අසා සිටි භික්ෂූන් වහන්සේලා ජීවිතය ගැන කලකිරීමට පත්වූහ. කම්පාවට පත්වූහ. උන්වහන්සේලාට සවන් දුන් අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ තමන් පෙර ආත්මවල දී පවා අප ජීවිතය ගැන මිනිසුනට අවබෝධ කර දුන් බව සිහිපත් කළහ. ඒ අතීත කථාව ජවනහංස ජාතකය යි.

අපහට මිතුරන් ලෙස මිනිසුන් පමණක් නොව සත්තු ද සිටිති. ඈත අතීතයේ බරණැස් නුවර පාලනය කළ බ්‍රහ්මදත්ත රජු හා එක් රාජහංසයෙක් මිතුරුව සිටියේ ය. මේ රාජහංසයාට බාල සොහොයුරන් දෙදෙනෙකි. දඟකාර සොහොයුරන් දෙදෙනා දිනෙක "අපි උදෑසන හිරු පායා, සවස බැසයන තෙක් හිරු සමග දුවමු" යැයි කතිකා කරගත්හ. නුවණැති රාජ හංසයා "ඔබ දෙදෙනා මෙපමණ වේලාවක් දුවන්නේ කෙසේ ද? එය නිෂ්ඵල ක්‍රියාවක් නොවේදැයි විමසී ය. එහෙත්

වැඩිමහල් සොයුරාට ඇහුම්කන් නොදුන් බාල දෙදෙනා හිරු සමග දුවන්නට පටන් ගත්හ. ඔවුනට රාජ හංසයා ද එකතු විය. දැන් හිරු ගමන් කරනා දිසාවට හංසයෝ තිදෙන දුවති. එක් කුඩා සොයුරෙක් ඉක්මනින් ම මහන්සි දැනී නතරවිය. අනෙක් කුඩා සොයුරා ද මඟ නතරවිය. එහෙත් රාජහංසයාට හිරු මුදුන්වන තුරු දිවීමට හැකි විය. මෙම ක්‍රියාවේ නිෂ්ඵල බව දැන සිටි රාජහංසයා ද තම දිවීම නැවැත්වී ය.

රාජහංසයා තම මිතුරු බ්‍රහ්මදත්ත රජු හට තමා හා සොහොයුරන් හිරු සමඟ දිවූ බව පැවසී ය. රජතුමා ඒ පිළිබඳ විස්තර ඇසීමට යුහුසුලු විය. "ඔබට කොපමණ වේගයෙන් දුවන්නට හැකි ද? රජ විමසී ය. රජතුමනි, මා හට ඊතලයකට වඩා වේගයෙන් දිවිය හැක.'' රාජහංසයා පිළිතුරු දුනි.

"එසේ නම් ලොව වැඩිම වේගය ඇත්තේ හිරුට නිසා ඔබට තරග වැදීමට නොහැකි බව පෙනේ " රජතුමා පැවසී ය.

නැත රජතුමනි, ඉතාමත් වේගයෙන් ගමන් කරන්නේ අපගේ ආයුෂයි, නැතහොත් ආයු සංස්කාරය යි, අපගේ රූපය, වයස හා ශරීරය ඒ අනුව වෙනස් වේ '' රාජ හංසයා ලොව වේගවත් ම ගමන ගැන මෙසේ පැහැදිලි කළේ ය.

එවිට බ්‍රහ්මදත්ත රජතුමා ඇතුළු රට වැසියෝ මරණ බියෙන් තැතිගත්හ. මෙය දුටු රාජහංසයා ''මහරජ ජීවිතය ගැන බිය නොවන්න. එදිනෙද වැඩ කටයුතු හොඳ සිහියෙන්, (යෝනිසෝමනසිකාරයෙන්) දස කුසල් රැස්කරමින්, රට පාලනය කරන්න. යහපත් ජීවිතයක් ගත කළ විට අවසානය ගැන බිය විය යුතු නැත. ටික දිනකින් රාජ හංසයා තම විලට පිටත් විය. රජතුමා මෙන් ම වැසියෝ ද යහපත් ජීවිත ගත කරමින් ජීවිත ආලෝකවත් කරගත්හ.

එකල බ්‍රහ්මදත්ත රජතුමා ආනන්ද තෙරණුවෝ ය. දඟකාර සොහොයුරන් දෙදෙන සැරියුත්, මුගලන් මහරහතන්

වහන්සේලා ය. රාජ හංසයා ලෙස දහම් දෙසුවෝ අප බුදුපියාණන් වහන්සේ ය.

රාජ හංසයා ලෙස රජතුමාගේ හා රටවැසියන් ගේ සිත් සනහා ලූ අප සම්මා සම්බුදුපියාණන් වහන්සේ මීට වසර දෙදහස් හයසියකට පෙර වෙසක් පුර පසළොස්වක පොහෝ දින සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. ලෝ වැස්සනට දුකින් මිදීමට ඇතිකර ගත යුතු ප්‍රතිපදාව - ආර්‍ය අෂ්ටාංගික මාර්ගය පහදා දී සසරින් එතෙර වන්නට නිවන් මඟ පෙන්වා දුන්හ. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි යහපත් පැවැත්ම සඳහා අප සැමවිට ම පව් නොකිරීමටත්, කුසල් රැස් කිරීමටත්, පිරිසිදු සිතින් ජීවිතය ගත කිරීමටත් අදිටන් කර ගනිමු.

**සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පද**

**සචිත්ත පරියෝදපනං - ඒතං බුද්ධානසාසනං**

බාලේ සිට ම දෙඩමලු බව දුර ලන්න
කාලේ ටිකක් වත් අපතේ නො යවන්න
ආලේ ඇති වැ ඉගෙනීමට වෙහෙසෙන්න
කාලේ සියලු දෙලොව ම වැඩ කර ගන්න

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමි**



# Blessed Are We To Know The Buddha ....

**Compiled by: Srima Warusawithana**

Blessed are we to know the Buddha, hear the sublime Dhamma,
Through the round of recurring birth and death,
In an arduous journey that sees no end; we travel
Seeking the way out of the tangled mire,
To reach the goal of supreme bliss;
This path the Buddha revealed, with boundless compassion to all,
Having first achieved the goal Himself, then teaching us, guiding us,
Helping us realize that amidst the fleeting happy times we enjoy,
There is always sorrow lurking hidden, bringing grief, misery, pain.
Incomparable is the Buddha's wisdom,
Immeasurable, His knowledge of the world and the entire Universe,
Amazing, unbelievable – the wondrous compassion, loving kindness
For every living creature upon this earth, high and low, rich and poor,
Mighty or meek; Buddha our Lord, supreme among gods and men,
Today, on this hallowed Vesak day, we pay reverence to our Lord
Born to illumine a world where darkness reigned,
The Buddha strode like a colossus living pure and virtuous,
For eighty long eventful years.
Fortunate are we to hear the Truth as taught by our noble Master,
The greatest, the wisest; the glorious Dhamma and the sacred Sangha,
Our solace our comfort, our never failing guiding light,
Pointing to the path that ends all suffering, ends all ills of life.